# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෂ

අංක 1654/25 - 2010 මැයි 21 වැනි සිකුරාදා - 2010.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති, මිනිස් බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 (2) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් කරුණු/චෝදනා හේතු කොට ගෙන කළුතර ප්‍රාදේශීය සභාවේ සභාපති ජී. එන්. පී. පෙරේරා මහතා විසින් කටයුතු කිරීමේ දී ඉහත කී ප්‍රඥප්තියේ 2 (1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේ ද යන්න පරීක්ෂා කර මාස තුනක් (3) ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒක පුද්ගල පරීක්ෂණ සභාවක් වශයෙන්, විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු බී. එල්. කේ. විමලචන්ද්‍ර මැතිතුමා, මෙයින් පත් කරමි.

*පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා :*

(අ) ජී. එන්. පී. පෙරේරා මහතා කළුතර ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් කටයුතු කරමින් 2009.06.04 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී කළුතර ප්‍රාදේශීය සභාවට අයවන උසාවි දඩ මුදලින් 5% ක දීමනා මුදලක් නිලධාරීන්ට ගෙවීමට අදාළව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 11 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 184 වගන්තිය යටතේ පනවන ලද 1988 ප්‍රාදේශීය සභා (රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පරිපාටි) රීති 11 වගන්තියට පටහැනිව ක්‍රියාකර කළුතර ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියක් ලබාගැනීමට කටයුතු කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) හා/හෝ 2(1)(ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වරදක්/වරදවල් සිදු කිරීම ;

(ආ) ජී. එන්. පී. පෙරේරා මහතා කළුතර ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් කටයුතු කරමින් 2009.06.10 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී කළුතර ප්‍රාදේශීය සභාවෙහි අංක 131 දරන ගෙවීම් වවුචරය මගින් කළුතර ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් පන්ලක්ෂ විසි අට දහස් විස්සයි ශත හතළිහක් (රු. 5,28,020.40) හෝ ඊට ආසන්න මුදලක් ටී. ඒ. පී. උපසේන සහ යූ.පී.ඩී. ශාන්ති යන නම් යටතේ සාවද්‍ය ලෙස ගෙවීම් කිරීමට සැලැස්වීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) වගන්තියෙහි සඳහන් වරදක් සිදු කිරීම ;

(ඇ) ජී. එන්. පී. පෙරේරා මහතා කළුතර ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් කටයුතු කරමින් 2009.06.22 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී කළුතර ප්‍රාදේශීය සභාවෙහි අංක 181 දරන ගෙවීම් වවුචරය මගින් කළුතර ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් දසලක්ෂ පනස්හත්දහස් පන්සිය හැත්තෑහතයි ශත තිහක් (රු. 10,57,577.30) හෝ ඊට ආසන්න මුදලක් ටී. ඒ. පී. උපසේන, යූ.පී.ඩී. ශාන්ති, ජී. ජී. ගම්මන්පිටිය, යසපාල වික්‍රමසිංහ, ඒ. කේ. එල්. ජයතිලක යන නම් යටතේ සාවද්‍ය ලෙස ගෙවීම් කිරීමට සැලැස්වීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) වගන්තියෙහි සඳහන් වරදක් සිදු කිරීම.

තව ද බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමසාරිස්වරයෙකු සතු බලතල මෙම පරීක්ෂණය සඳහා විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු බී. එල්. කේ. විමලචන්ද්‍ර මහතා වෙත හිමිවන අතර, මෙම පත් කිරීම් දින සිට තුන්මසක කාලයක් ඇතුළත අදාළ පරීක්ෂණය සිදු කර, පරීක්ෂණවල නිගමන ඇතුළත් වාර්තාවක් මා වෙත ඉදිරිපත් කරන ලෙස ද, දන්වනු කැමැත්තෙමි.

ඉහත සඳහන් කරුණු පරීක්ෂා කිරීමේ දී අදාළ කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උපලේඛනයට ඇතුළත් කර ඇති බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති,
මිනිස් බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

2010 මැයි මස 19 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

*වාචික සාක්ෂි:*

1. අශෝකා ගුණවර්ධන මහත්මිය, ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
2. එම්. ඒ. නිරෝෂා ප්‍රියදර්ශනී මෙනෙවිය, ආදේශක කම්කරු, කළුතර ප්‍රාදේශීය සභාව
3. ඩබ්ලිව්. වී. ඩී. අනුෂා ඉමන්ති ජයතිලක මෙනෙවිය, කළමනාකරණ සහකාර, කළුතර ප්‍රාදේශීය සභාව
4. එම්. එම්. කුසුමාවති කුමාරිහාමි මහත්මිය, කළමනාකරණ සහකාර, පළාත් පාලන දෙපාර්තමේන්තුව
5. ඩබ්ලිව්. සී. එච්. ද සොයිසා ගුණසේකර මහත්මිය, ලේකම්, කළුතර ප්‍රාදේශීය සභාව.
6. රෙජිස්ට්‍රාර්, මහෙස්ත්‍රාත් අධිකරණය, කළුතර.

*ලිඛිත සාක්ෂි:*

1. කළුතර ප්‍රාදේශීය සභාවේ 2009.06.10 දිනැති අංක 131 දරන වවුචරය සහ ඊට අදාළ ඇමුණුම්
2. කළුතර ප්‍රාදේශීය සභාවේ 2009.06.22 දිනැති අංක 181 දරන වවුචරය සහ ඊට අදාළ ඇමුණුම්
3. කළුතර ප්‍රාදේශීය සභාවේ 2009.06.04 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව
4. කළුතර ප්‍රාදේශීය සභාවේ 2009 ජූලි මස සභා රැස්වීම් වාර්තාව
5. පළාත් පාලන කොමසාරිස් ගේ (බ.ප.) 2004.07.06 දිනැති අංක LGD/06/03/01/02(1) දරන ලිපිය
6. කළුතර ප්‍රාදේශීය සභාවේ අංක 039-1-001-2-2997957 දරන බැංකු ගිණුමට අදාළ 2009 ජූනි මස බැංකු ප්‍රකාශය
7. කළුතර ප්‍රාදේශීය සභාවේ 2009 ජූනි මස ගෙවීම් මුදල් පොත.

06-136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.